# Summaries in Sinhala

**ළමුන්ට මිත්‍රශීලී වාතාවරණයන්: ප්‍රතිඵල සහ බලපෑම පදනම් කරගෙන දැනට පවත්නා සාක්ෂි පිළිබඳව ක්‍රමානුකූල සමාලෝචනයක්**

හදිසි අවස්ථාවන්හිදී ළමුන් අවදානමට ලක්වීමෙන් මුදවා ගැනීමට, ළමුන්ගේ මනෝසමාජයීය සුභසාධනය ප්‍රවර්ධනය කිරීමට සහ ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රජාව තුල ශක්‍යතාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා බහුලව/පුලුල් වශයෙන් ළමා හිතකාමී ස්ථාන යොදා ගනු ලැබේ. මේ හා සම්බන්ධව ලියැවී ප්‍රකාශයට පත්කරන ලද සහ ප්‍රසිද්ධියට පත් නොකරන ලද කරුණු ක්‍රමානුකූලව පිරික්සා බැලීමේදී අධ්‍යයන 10 ක් මෙම විශේෂිත අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාපටිපාටියේ නිර්නායකයන්ට අනුකූල බව පෙනීගියේය. මෙම සෑම අධ්‍යයනයක්ම ඒවායේ මැදිහත්වීම් මගින් ඇතිවිය හැකි ආරක්ෂණ, ප්‍රවර්ධන සහ සජීවීකරණ බලපෑම් සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් සමාලෝචනය කරන ලදී. මෙම අධ්‍යයන 10 දීම විශේෂයෙන්ම මනෝසමාජයීය යහපැවැත්ම සම්බන්ධයෙන් ළමා හිතකාමී ස්ථානයන් පවත්වාගෙන යාම ධනාත්මක ප්‍රතිඵල ලබාදෙන බව වාර්තා කර ඇත. කෙසේ වෙතත් මෙම සැලසුමේ පැවැති ප්‍රධාන දුර්වලතාවය වූයේ කාලයත් සමග ඇතිවුනු වෙනස්කම ශක්තිමත් ලෙස තහවුරු කිරීමට අසමත්වීම (මැදිහත්වීමට පෙර පැවැති මූලිකතත්වය වාර්තා කර ඇත්තේ අධ්‍යයන තුනක් පමණකි) හෝ මෙම වෙනස්කම් මෙම මැදිහත්වීම නිසා සිදුවූ බවට සම්බන්ධ කිරීමට නොහැකිවීමයි (අධ්‍යයන දෙකක පමණක් ළමා හිතකාමී ස්ථාන නොමැති ප්‍රජාවන් දෙකක් සමග සැසඳීම් ඉදිරිපත් කර ඇත). විශ්ලේෂණ වලින් වාර්තා කිරීමට සහ ප්‍රතිඵල හා බලපෑම මැනීමට මහත් කැපවීමක් අවශ්‍යය බවත්, ක්‍රියාවලින්, ප්‍රතිදාන, ප්‍රතිඵල සහ බලපෑම නිවැරදිව මැනීමට සම්මත සහ නිවැරදි මැනීම් අවශ්‍යය බවත්, ඇගයුම් සැලසුම් මගින් වඩාත් නිවැරදි ලෙසට මැදිහත්වීම් වලින් තොර ප්‍රතිඵල විමසා බැලිය යුතු බවත්, ඇගයුම් සන්ධර්භය හා ළමුන් සම්බන්ධ කර තබා ගැනීමේ අවශ්‍යතාව සහ සාක්ෂි මත බලගැන්වෙන මැදිහත්වීම් ස්ථාපිත කරගැනිම සඳහා දිගුකාලීන පසුහාර වැඩකටයුතු අත්‍යාවශ්‍ය බව යෝජනා කරනු ලබයි.

**මූලික යෙදුම්:** ළමා හිතකාමී ස්ථාන, මනෝසමාජයීය, ළමා ආරක්ෂණය, ඇගයීම, ප්‍රතිඵල, මානුෂීය, හදිසි අවස්ථාවන්

---

**උතුරු උගන්ඩාවේ බලහත්කාරයට ලක්වූ මව්වරුන්ගේ අත්දැකීම්: යුද්ධයේ උරුම වූ දේ**

1986 සිට 2007 වසර දක්වා ලෝඩ්' රෙසිස්ටන්ස් යුධහමුදාව උතුරු උගන්ඩාවේ පුරවැසියන් දරුණු අන්දමින් ඝාතනය කිරීමත් ළමුන් පැහැරගැනීමත් සිදුකරන ලදී. මෙහිදී පැහැර ගන්නා ලද පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් යන දෙපිරිසටම ආයුධ පුහුණුව ලබාදුන් අතර පැහැරගත් ගැහැණු ළමුන් බලහත්කාරයෙන් 'භාර්යාවන්' වශයෙන් තබාගැනීම සඳහා අණදෙන නිලධාරීන් අතර පොදුවේ බෙදා දෙන ලදී. මෙමගින් කම්පනයට පත්වූ ගැහැණු ළමුන් සහ තරුණ කාන්තාවන් (ගැබිනි සහ බලහත්කාරයෙන් භාර්යාවන් වශයෙන් තබාගන්නා ලද) යුද්ධයට සම්බන්ධවී සිටි අනෙකුත් සටන්කරුවන්ට වඩා වැඩිකාලයක් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල රඳවා තබාගන්නා ලදි. මෙම මධ්‍යස්තාන වලදි ඔවුන්ට විශේෂ වරප්‍රසාද ලබාදෙනු ලැබුවත් නැවත සමාජගත කළ පසු ඔවුන්ගේ ප්‍රජාව මෙම මව්වරුන් සහ ළමුන් අවමානයටත් අවසැලකිල්ලටත් පත්කළහ. මෙම ලේඛනය මගින් මෙසේ බලහත්කාරයෙන් භාර්යාවන් වශයෙන් රඳවාගනු ලැබූ මව්වරුන් සහ ළමුන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයේදී සහ සමාජ ගත කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන් මුහුණු දුන් අත්දැකීම් සාකච්ඡා කරනු ලබයි. මීට අමතරවව මෙම බලහත්කාරයට ලක්වූ මව්වරු සහ ළමුන් මානව හිමිකම් උල්ලංගනයවීම් ගණනාවකට මුහුණු දී දිවිබේරාගත් පිරිසක් ලෙස දැකීම සඳහා ප්‍රජාව හැඩගැස්විය හැකි ආකාරය ද පරීක්ෂා කර බලයි.

**මූලික යෙදුම්:** බලහත්කාර මව්පදවිය, මනෝසමාජයීය අවශ්‍යයතා, ළමුන් නැවත සමාජගත කිරීම, උගන්ඩාව

---

**පොදු බැඳීම්: ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචන්ඩත්වයෙන් බේරුණු පුද්ගලයින් යථාතත්වයට පත්කිරීම සඳහා වැඩසටහනක්**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට මුහුණ දී බේරුණු පුද්ගලයින් ඉලක්ක කරගෙන විවිධවූ පැතිකඩයන් ඔස්සේ සිදුකරන ලද මැදිහත්වීමේ වැඩසටහනක් ඉක්වදෝරයේ ඇග්‍රියෝ හි දී සහ අසල පිහිටි කොළොම්බියානු සරණාගත ජනාවාසයන්හි පවත්වන ලදී. කාන්තාවන්ගෙන් සැදුම්ලත් කුඩා කණ්ඩායම් සමග මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය පහසුකම් සලසන්නන් පුහුණු කරන ලදී. මෙම වැඩසටහන මගින් අත් මැෂින් උපයෝගී කරගෙන ඇඳුම් මසනු ලබන කාන්තාවන්ගේ කණ්ඩායම් සඳහා චිත්‍ර ඇඳීම උපයෝගී කරගෙන චිකිත්සා ලබාදීමේ තාක්ෂණයන්, මනෝවිද්‍යා අධ්‍යාපනය, සමවයස් කන්ඩායමේ සහය ලබාගැනීම රෝගලක්ෂණ අවම කිරීමේ තාක්ෂණයන් සහ මනෝ සමාජයීය කුසලතාවන් ගොඩනැංවීම හඳුන්වා දෙන ලදී. සහභාගිකයින් තම අත්දැකීම් බෙදාගැනීමටත් මතකයන් ක්‍රියාවට නැංවීමටත් රෙදිපිලිවල වෘතාන්ත චිත්‍ර නිර්මාණය කළහ. මෙම ලිපිය මගින් මෙම ප්‍රජාවේ මෙම ආදර්ශ වැඩසටහන සංවර්ධනය කළ ආකාරයත් එය ක්‍රියාවට නැංවීම පිළිබඳවත් ලේඛනගත කරනු ලබයි.


Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

**මූලික යෙදුම්:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, කලා කටයුතු ඇසුරින් සිදුකරන චිකිත්සාව, කළමනාකරණ කුසලතාවන්, විචිත්‍ර රෙදිමෝස්තර

---

**නේපාලයේ සිටින භූතාන සරණාගතයින් සඳහා මනෝ සමාජයීය සහය සැලසීම**

වසර 20 කට වැඩිකාලයක් භූතාන සරණාගතයින් දහස් ගණනක් දැඩි අවිනිශ්චිතතාවයට හා අභියෝගවලට මුහුණ දෙමින් නැගෙනහිර භූතානයේ අනාථ කඳවුරු වල ජීවත් වෙති. වර්තමානයේ, ඔවුන් නැවත පදිංචි කිරීම ඔවුන්ගේ ජීවිත වලට තවදුරටත් අභියෝගාත්මක තත්වයක් උදාකරයි. මෙම තත්ත්වය මනාව හඳුනාගනිමින් නේපාලයේ රාජ්‍ය නොවන සංවිධානයක් වන "ට්‍රාන්ස් කල්චරල් මනෝ සමාජීය සංවිධානය" (Transcultural Psychosocial Organisation) එක්සත් ජාතීන්ගේ සරනාගතයින් පිළිබඳව මහකොමසාරිස් කාර්යාලය (UNHRC) සහ වෙනත් මානුෂීය සේවා සංවිධානයන් සමග මෙම සරණාගතයින්ට මනෝ සමාජයීය සහයෝගයන් ලබාදේ. මෙම ක්ෂේත්‍ර වාර්තාවේ එහි පැනනැගී ඇති මනෝ සමාජයීය ගැටලු, සිදුකරන ලද මැදිහත්වීම්, ඒ තුලින් පැනනගින තත්ත්වයන් මෙන්ම උගත් පාඩම් අඩංගු වී ඇත. එසේම මෙහි සරනාගතයෙකු පිළිබඳ ප්‍රත්‍යෙයික වාර්තාවක්ද අඩංගුවේ. මෙම වැඩසටහන යටතේ සිදුකරන ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙසට ඍජු මනෝ සමාජයීය සහය ලබාදීම, මනෝවිද්‍යා අධ්‍යාපනය සහ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහන් කළ හැකි අතර, මෙහිදී මෙම සේවා සරණාගතයින්ට පමණක් නොව, සත්කාරක ප්‍රජාව සහ ආධාර ලබාදෙන කණ්ඩායම් ද ඉලක්ක කරගන්නා ලදී. මෙහි අඩංගු නිර්දේශ අතර සරණාගතයින් සහ සත්කාරක ප්‍රජාවන් ඉලක්ක කරගත් සේවා දිගින් දිගටම ශක්තිමත් අයුරින් පවත්වාගෙන යාම, අවදානමට මුහුණු දී ඇති කණ්ඩායම් වලට වැඩි අවධානයක් දැක්වීම (වැඩිහිටි ප්‍රජාව වැනි) සහ දේශිය සහ අන්තර්ජාතික සේවා සහ ව්‍යුහයන් සමග සහයෝගය හා සම්බන්ධතා වැඩිදියුණු කරගැනීම ඇතුළත්ය.

**මූලික යෙදුම්:** භූතාන සරණාගතයින්, නේපාලය, මනෝසමාජයීය, දිගින් දිගටම පවත්නා, නැවත පදිංචිය

---

**මානුෂීය ව්‍යාපෘතින්හි මනෝසමජයීය අංගයන් ඇගයීමට ලක් කිරීම**

අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා වන කඳවුරු සහ නැවත පදින්චි කර වීමේ ප්‍රදේශයන් හි වැඩකරන මනෝසමාජයීය ක්‍රියාකාරීන් පිරිසකගේ ක්‍රියාකාරකම් ඇගයීමක් මෙහි කතුවරයා විස්තර කරයි. මෙහිදී ඔවුන් අනුගමනය කර ඇති ක්‍රමවේදය වන්නේ පොදු දැණුම හා සිතට දැනෙන දේ අනුව තීරණ ගැනීමයි. නමුත් මෙහිදී ඔවුන් ට තම මැදිහත්ම් හා එහි ඉලක්කයන් පිළිබඳ පැහැදිළි දැක්මක් හෝ ඔවුන් විසින් භාවිතා කළ ක්‍රමවේදයන් හා ඔවුන්ගේ ඉලක්ක අතර ඇති සම්භන්ධය පිළිබඳ නිසි දැක්මක් නොවීය. එසේම ඔවුන් කඳවුරුවල හෝ නැවත පදින්චි කිරීම් සිදු කෙරුණු ප්‍රදේශ තුල එකී මැදිහත් වීම්වලින් සිදුව ඇති භෞතික සජීවී-පාරිසරික බලපෑම හෝ බලපෑමක් නොමැතිකම ඔවුන් විසින් අධ්‍යයනය නොකරන ලදි. මෙම කරුණු සම්මුඛ සාකච්ඡාවලදී මෙන්ම වැඩමුලුවකදී සාකච්ඡාවට ගැණුන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ මනෝසමාජයීය ක්‍රියාකාරකම් හා අනෙකුත් ක්‍රියාකාරකම් එකතුන් සඳහා කිසියම්, පැහැදිළි තර්කානුකූල මැදිහත්වීමේ නිර්නායකයන් ගොඩනංවන ලදි. එසේම මේ වන තෙක් ඔවුන් විසින් භාවිතා නොකරන ලද පුහුණු කිරීම් තුලින් මනෝසමාජයීය ක්‍රියාකරුවන්ගේ හැකියාවන් හා අවබෝධය වර්ධනය තුලින් මනෝසමාජයීය ක්‍රියාකාරකම්වල ගුනාත්මක බව වර්ධනය කළ හැකි බව පැහැදිළි විය. මේ නිසා, මෙම වාර්ථාව මගින් අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා වන කඳවුරු සහ නැවත පදින්චි කර වීමේ ප්‍රදේශයන් සඳහා මොන ආකාරයේ මනෝසමාජයීය ක්‍රියාකාරකම් වැඩසටහන් තුලට ඇතුලත් කළ හැකිද යන්න හා භෞතික සජීවී-පාරිසරික තත්ත්වයන් වර්ධනය කිරීම ඇමුණ කොටගත් මැදිහත් වීම්වල වැදගත්කම පෙන්වා දේ.

**මූලික යෙදුම්:** අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා වන කඳවුරු, නැවත පදින්චි කර වීමේ ප්‍රදේශයන්, තර්කානුකූල මැදිහත්වීමේ, පැහැදිළි නිර්නායකයන්, ඇගයීම

---

**'සියලු සම්භාවිතාවන්ට එරෙහිව': ඉරක ජාතික සරණාගතයින් සහ අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ සිරියානු ජාතිකයන් සඳහා සැකසුණු එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන ඒජන්සියේ මානසික සෞඛ්‍යය සහ මනොසමාජයීය සහාය වැඩසටහන**

යුධ වදින රටක් තුල ධනාත්මක කතාපුවත් හෝ ලිපි සොයා ගැනීම බොහෝ විට අපහසු කාර්යයකි. නිරන්තරයෙන් තීව්‍රවන අසහනකාරී තත්ත්වයන්ගෙන් පීඩිත ජන කොටසකට දෛනික වශයෙන් මානුෂීය සේවා සපයන සේවකයන් විසින් සලසන මානසික සෞඛ්‍යය හා මනෝසමාජයීය සහායයන් පුවත්පත් සිරස්තලයක් බවට පත්වීම ඉතාම විරල සිද්ධියකි. 2008 වසරේ සිට සිරියාවේ එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන ඒජන්සිය විසින් ඉරාක ජාතික සරණාගතයින් සඳහා සියලු අංශ වෙත අවධානය යොමු කෙරුණු මානසික සෞඛ්‍යය හා මනෝසමාජයීය සහාය වැඩසටහනක් එම සරණාගත ජනතාවගේ හැකියාවන් මත සකස් කොට ක්‍රියාත්මක කෙරේ. 2012 වසරේදී මෙම වැඩසටහන යුද්ධයේ බලපෑමට පත් සිරියානු ජාතිකයන් වෙතත් ව්‍යාප්ත කෙරුණි. සමූහ නවාතැන්වල රැඳී සිටින අවතැන් වූවන් ඉලක්ක කොට ගනිමින් සහාය ලබා දීම පිණිස පිටස්තර ප්‍රදේශ වෙත ගමන්කරන ස්වෙච්ඡා සේවකයින් විසින් තනි පුද්ගල



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

ප්‍රශ්න වෙත අවධානය යොමු කිරීම, පවුල් හා සමාජ කණ්ඩායම් මට්ටමේ සහාය සැලසීම් වැනි ක්‍රම සංකලනයක් මගින් සහාය සැලසීම සිදු කෙරේ.

**මූලික යෙදුම්:** සිරියාව, ආයුධ සන්නද්ධ ගැටුම්, සරණාගතයින්, අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූවන්, පිටස්තර ප්‍රදේශ වෙත ගමන්කරන ස්වෙච්ඡා සේවකයින්

---

**කොන්ගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ එබෝලා වසංගත තත්ත්වයන් හිදි මානසික සහය ලබාදීම**

මෙම වාර්තාව මගින් 2007 වසරේදී කොන්ගෝවේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ එබෝලා හිමෝග්‍රැගික් උණ වසංගතතතවයන් හිදි වෙනත් රටකින් පැමිණි මනෝවිද්‍යාඥවරියක් ලෙස මෙම කතුවරිය ලබාගත් අත්දැකීම් ආවර්ජනය කරයි. සීඝ්‍රයෙන් පැතිරීයා හැකි මෙම මාරක රෝගයට තවමත් ප්‍රතිකාර නොමැතිවීම නිසා මෙය වැළැක්වීමේ එකම විසඳුම වන්නේ රෝගය වැළඳුන අය වෙන් කිරීමයි. මෙමගින් දේශිය ජනතාවට සහ පිට රටින් පැමිණි කාර්යය මණ්ඩලයට තරමක් දුරට වෙනස් වූ බලපෑම් සහ ප්‍රතිවිපාකයන් ඇතිවිය. කෙසේ වෙතත් මෙම තත්ත්වයන් සමග කටයුතු කරන ආකාරය පිළිබඳව සොයා බැලීමේදී හා එහි ඇති වූ භයානක තත්ත්වයන් සමග කටයුතු කිරීමේදී පිට රටින් පැමිණි කාර්යය මණ්ඩලය සහ දේශීය ජනතාව යන දෙපාර්ශවයම බලරහිත තත්ත්වයට පත්වී ඇති බව පෙනීගියේය.

**මූලික යෙදුම්:** එබෝලා හිමෝග්‍රැගික් උණ, ප්‍රජාතන්ත්‍රවාදී කොංගෝ ජනරජය, මනෝ සමාජයීය මැදිහත්වීම, අන්තර්-සංස්කෘතික මනෝචිකිත්සාව



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.